Good Food, Good Life

Nestlé Lanka PLC News Release
Colombo: 29 September 2016

# නෙස්ලේ 'කිරි ගොවි දිරිය' හඳුන්වා දෙයි

*ගොවීන් 3,000කට වැඩි පිරිසකට නෙස්ලේ සමාගමෙන් පුහුණුව සහ සංවර්ධනය*

ජාත්‍යන්තර වශයෙන් තම 150 වැනි සහ දේශීය වශයෙන් තම 110 වැනි සංවත්සරයන් සැමරීමට සමගාමීව නෙස්ලේ සමාගම 'කිරි ගොවි දිරිය' නමින් ශ්‍රී ලාංකීය කිරි ගොවීන් 3,000 කට ප්‍රතිලාභ ලබා දෙන වැඩසටහනක් දියත් කර තිබේ. පුහුණුව සහ සංවර්ධනය සමගින් නවීන තාක්ෂණය සහ විශිෂ්ට භාවිතාවන් ඉගෙන ගැනීම සහ උසස් තත්ත්වයේ කිරි වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා 'කිරි ගොවි දිරිය'වැඩසටහනින් අවස්ථාව ලැබී තිබේ.

තම සංවත්සර සැමරීමට සාපේක්ෂව ප්‍රජාව වෙනුවෙන් තමන් දක්වන කැපවීම පෙන්නුම්කරන වැඩසටහන් කිහිපයක් නෙස්ලේ සමාගම දියත් කරන ලද අතර 'කිරි ගොවි දිරිය' එහි පළමු වැන්නයි. ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය ගරු පී. හැරිසන් මැතිතුමාගේ සහභාගීත්වයෙන් අනුරාධපුරයේදී මෙම සුවිශේෂ වැඩසටහන දියත් කළ අතර මේ යටතේ වැඩසටහන් 150 ක් හරහා කිරි ගොවීන් 3,000කට ප්‍රතිලාභ හිමි වේ. කිරි නිෂ්පාදනයට අත්‍යවශ්‍ය උපකරණ කිරි ගොවීන් 150 ක් වෙත පිරිනමමින් ඔවුන්ගේ ව්‍යාපාරයෙහි සංවර්ධනයට සහයෝගය ලබා දීමද මෙහිදී සිදු වේ.

''ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීම වෙනුවෙන් නෙස්ලේ සමාගම හදවතින්ම කැපවී සිටිනවා. අපේ කිරි ගොවීන් අපගේ ගමන් මග පුරාවට විශාල කාර්යභාරයක් ඉටු කර ඇති නිසා කිරි ගොවීන් වෙනුවෙන් අප දක්වන බැඳීම යළි තහවුරු කිරීමට අපට අවශ්‍යයි. මෙම සුවිශේෂී කැපවීම් හරහා අප සමග දෛනිකව කටයුතු කරන කිරි ගොවීන්ට ධනාත්මක ප්‍රතිලාභ ලැබෙන අතර කිරි කර්මාන්තයේ සංවර්ධනයට අප ගනු ලබන උත්සාහයන්ට ශක්තිය ලබාදීමද සිදු වෙනවා. කිරි කිර්මාන්තයේ සෞභාග්‍යය ළඟා කරගැනීමට දායක වෙමින් අවසානයේදී අපේ ගොවීන්ගේ ජීවිතවල තත්ත්වය ඉහළ නැංවීම මේ හරහා සිදු වෙනවා.'' යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය පැවසුවාය.

ශ්‍රී ලංකාවේ කිරි ගව පාලන කර්මාන්තය තවමත් සංවර්ධනය වෙමින් පවතින මට්ටමේ ඇති නිසා දේශීය වශයෙන් නැවුම් කිරි නිෂ්පාදන ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමට ඊට හැකියාවක් නොමැත. කිරි ගව පාලන කර්මාන්තයේ සංවර්ධනයට සහයෝගය ලබා දෙමින් ඊට අදාළ ආයතනික ව්‍යුහය සමග නෙස්ලේ සමාගම කටයුතු කරන්නේ 1980 දශකයේ ආරම්භයේ සිටය. කිරි සැපයුම සහ ප්‍රමිතිය ඉහළ නැංවීම පමණක් නොව දේශීය කිරි ගොවීන්ට තිරසාර ජීවනෝපායක් සහතික කිරීමත් නෙස්ලේ සමාගමේ අපේක්ෂාව වී තිබේ.

කිරි එකතු කිරීමේ සහ කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන වැනි ඉතා වැදගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අමතරව කිරි දෙනුන්ට ආහාර ලබා දීම, කිරි දෙනුන් බෝ කිරීම, සත්ව සෞඛ්‍යය, ගොවිපොළ කළමනාකරණය වැනි තාක්ෂණික මාතෘකා තුළින් පුළුල් පරාසයක පුහුණු සංවර්ධන වැඩසටහන් ගොවීන් වෙනුවෙන් පැවැත්වීමට නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි. එපමණක් නොව කිරි ගව ගොවිපොළ සංවර්ධනය වෙනුවෙන් මූල්‍ය සහයෝගය ලබා දෙමින් උසස් ප්‍රමිතියේ ගව පැටවුන් බෝ කිරීම සඳහා කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමටද කටයුතු කරයි. රජය සමග එකමුතුව ජංගම පශු සායන පවත්වමින් ශ්‍රී ලාංකීය කිරි ගොවීන්ට තම ජීවනෝපාය වඩාත් හොඳින් කර ගෙන යාමට අවස්ථාව ලබාදීමටද නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි.

නෙස්ලේ සමාගම ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ විශාලතම නැවුම් කිරි මිලදී ගන්නා සමාගමයි. කිරි ගොවීන් 20,000කට අධික පිරිසකගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවනෝපාය සුරක්ෂිත කරමින් පාරිභෝගිකයින් වෙත පුළුල් පරාසයක නිපැයුම් පෙළක් දේශීය නැවුම් කිරි යොදාගෙන නිපදවීමට නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි. ඒ හරහා ග්‍රාමීය ප්‍රජාවන් දියුණුව කරා යොමුකරමින් ඔවුන්ගේ ඉදිරි වර්ධනයන් සඳහා අතදීමටද නෙස්ලේ සමාගම කටයුතු කරමින් සිටී. 2015 වර්ෂයේදී නෙස්ලේ ලංකා සමාගම නැවුම් කිරි මිලදී ගැනීම හරහා දේශීය කිරි ගව පාලන කර්මාන්තයට ලබා දී ඇති දායකත්වය මුදලින් රුපියල් බිලියන 3.6 ක් ලෙස සනිටුහන් වෙයි.